**වැවිලි අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ඇබෑර්තු

තලවකැලේ පිහිටි තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික)

**රැකියා විස්තරය :**

වාහන සමූහය නඩත්තු කිරීම, පැවරුම් කාර්ය ක්ෂේත්‍රය සංවිධානය කිරීම හා ප්‍රවාහන ඒකකයේ හා මෝටර් ගරාජයේ කාර්යයන්හි සාධාරණ ඵලදායිත්වයක් පවත්වාගැනීම සඳහා තමන් යටතේ සේවය කරන කාර්ය මණ්ඩලය මනාව පාලනය කිරීම හා කළමනාකාරීත්වය විසින් කලින් කලට පවරනු ලබන වෙනත් කාර්ය ඉටු කිරීමේ වගකීම දරයි.

**බාහිර :**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (යාන්ත්‍රික) **හෝ** ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES),

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද.

**සටහන :**

යාන්ත්‍රික (රථවාහන) නඩත්තු ක්‍රියාකාරකම් සම්බන්ධව කටයුතු කිරීමේ දැනුම සතුවීම අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර :**

අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන්, එක් වරකදී විෂයයන් තුනකින් (03) සමත්වීම සහ I ශ්‍රේණියේ තාක්ෂණවේදී නිලධාරී (යාන්ත්‍රික) ලෙස වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වැටුප් පරිමාණය :**

JM 1-2 (2016) රුපියල් 43,355 - 10x755 - 18x1,135 - රුපියල් 71,335/- (මසකට)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක් හෝ / සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. ඉංජිනේරු සහකාර (විද්‍යුත්)

**රැකියා විස්තරය :**

ප්‍රධාන කාර්යාලයෙහි මෙන්ම ප්‍රාදේශීය මධ්‍යස්ථාන හා වතුයායන්වල විදුලි ඒකකයන්හි සමස්ත ක්‍රියාකාරීත්වය හා නඩත්තු කටයුතු පිළිබඳ වගකීම දරනු ලබන අතර, කළමනාකාරීත්වය විසින් කලින් කලට පවරනු ලබන අනෙකුත් රාජකාරිද ඉටුකළ යුතුය.

**බාහිර :**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (විදුලි) **හෝ** ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES),

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක විදුලි ඉංජිනේරු අංශයේ සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද.

**සටහන :**

විදුලිමය / ඉලෙක්ට්‍රොනික් ක්‍රියාකාරකම්වල නඩත්තු කටයුතු සම්බන්ධව කටයුතු කොට තිබීමේ දැනුම අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර :**

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ, එක්වරකදී, විෂයයන් තුනකින් (03) සමත්වීම සමග I ශ්‍රේණියේ තාක්ෂණවේදී නිලධාරී (විද්‍යුත්) ලෙස වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වැටුප් පරිමාණය :**

JM 1-2 (2016) රුපියල් 43,355 - 10x755 - 18x1,135 - රුපියල් 71,335/- (මසකට)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක් හෝ / සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### වෙනත් ප්‍රතිලාභ :

i) නවාතැන් පහසුකම් (සම්පූර්ණ ගෘහභාණ්ඩ සහිත නිල නිවාස / නේවාසිකාගාර කාමර) පවතීනම් ලබා දෙනු ලබන අතර, නැතහොත් ඒ වෙනුවෙන් යම් දීමනාවක් ලබාදේ.

ii) ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයෙහි දැනට පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ ලබාදේ.

iii) ආයතනයේ මාර්ගෝපදේශ ප්‍රකාරව, හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලයේ ප්‍රවාහන පහසුකම් ලබාදේ.

iv) සෑම සති අග අන්තයකම, තලවකැලේ ශාන්ත කූම්බ්ස් සිට කොළඹ හා මහනුවර දක්වා ප්‍රවාහන පහසුකම් ලබාදේ.

v) **සේවක අර්ථසාධක අරමුදල** : තෝරාගත් අයදුම්කරු විසින් තම වැටුපෙන්, 10% ප්‍රමාණයකින් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා 15% ප්‍රමාණයක් දායකත්වයක් දරයි. එසේම ආයතනය විසින් සේවක භාරකාර අරමුදලටද අමතර 3% ක දායකත්වයක් දරයි.

vi) තේ පර්යේෂණ ආයතනයේ සේවකයන්හට අදාළ අනෙකුත් ප්‍රතිලාභද හිමිවේ.

මෙම තනතුරු ස්ථිරයි. ඔබගේ අයදුම්පත්, සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික හා අනෙකුත් වෘත්තීය සුදුසුකම්, සේවා සහතිකවල පිටපත් සහිතව, අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම තක්සේරු කිරීමට හැකි ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් අය වෙත **2021 පෙබරවාරි 22** දිනට යොමු කළ යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන සේ එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමුවන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**